# ජනතාව සඳහා ඉඩම්

(ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පළමුවැනි සංවත්සරයේදී ''ඉඩම් ප්‍රතිසංස්කරණය හා පලදා වර්ධනය'' යන මැයෙන් පැවැත්වුනු සම්මන්ත්‍රණයක් ඇසුරෙන් සකස් කෙරෙන ලිපියකි)

''හුදෙක්ම ඉඩම් තමන් සන්තකව තබා ගැනීමට හා අයිති කර ගැනීමට ඉඩම් ගැන ආශාවක් දැක්වීම මේ රටේ බොහෝ දෙනෙකුගේ සිරිතක් උනා. භූමිය සමාජය සතු වත්කමක් වාගේම නිෂ්පාදන ක්‍රමයක්. ඉඩම් හිමිව තිබීමෙන්ම පමණක් පලදාව වැඩිවීම, රැකීරක්ෂා මාර්ග බිහිවීම, සාධාරණ විදියට ආදායම් බෙදී යාම ආදිය සිදුවන්නේ නැහැ. රටෙහි හැම වැසියෙකුටම සමාජයීය අතින් සාධාරණ, මානසික අතින් සෑහීමට පත්වන්නට පිළිවන් ආදායමක් ලබාදීම ඕනෑම ආණ්ඩුවක යුතුකමක්. උග්‍ර රැකීරක්ෂා හිඟයකටත්, කර්මාන්ත සඳහා උවමනා කරන විදේශ සම්පත් හිඟයකටත් අප මුහුණ පා සිටියදී, රැකියා නැතුව සිටින තරුණ තරුණියන්ට සැළකිය යුතු ඉඩම් ප්‍රමාණයක් හිමි කර දී ඔවුන්ගේත් ජනතාවගේත් ශුභසිද්ධිය සඳහා එම ඉඩම් නිෂ්පාදනයට යොදවා ගන්නට පිළිවන් වන විදියට ඉඩම් අයිතිය සීමා කිරීමේ පනත වෙනුවට ගත යුතු වෙනත් ක්‍රියා මාර්ගයක් තිබුනෙ නැහැ. මේ රටේ ඇති කර තිබෙන ඉඩම් ප්‍රතිසංස්කරණ නීති රීති ද්වේශයෙන් නැති නම් වෛරයෙන් උසි ගැන්වීම නිසා ඇති කරන ලද ඒවා නොවන බව අපට හොඳින් ඒත්තු ගිය කාරණාවක්. මෙය සංවර්ධනයට යොමු වන මාර්ගයක්; අපට එය යුතුකමක් මෙන්ම දයාවෙන් යුත් ක්‍රියා මාර්ගයක්.''

සම්මන්ත්‍රණය ආරම්භ කරමින් කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ඉහත සඳහන් විදියට පැවසුවා.

ශ්‍රී ලංකාවේ මෑත කාලයේදී ඇති වුනු ඉතාමත් බැරෑරුම් තත්වයකට අපි අද මුහුණ දී සිටිමු. උග්‍ර ආහාර හිඟයක් පවතින නිසා අපට අවශ්‍ය ආහාර වලින් හැකි තරම් ප්‍රමාණයක් ඉතාමත් ඉක්මණින් නිපදවා ගැනීම අත්‍යාවශ්‍යයි. දෙවැනි ප්‍රශ්නය රැකීරක්ෂා නැතිකමයි. හොඳ අධ්‍යාපනයක් ලබාපු තරුණයින් බොහෝ දෙනෙක් පාසැලින් අස්වුනාට පස්සෙ කරන්න සුදුසු රක්ෂාවල් නැතිව බලාපොරොත්තු නැති කර ගන්නවා. රජයේ සේවයේ, පෞද්ගලික සමාගම් ආදියේ වගේම ඉස්සර රස්සාවල් ලැබුණ නොයෙක් තැන්වල රස්සාවල් කොහෙත්ම නැතුව යන්න ආසන්නයි. ඒ නිසා මේ තරුණ අය බලාපොරොත්තු වන විදියේ රැකියාවල් ඒ මාර්ග වලින් තවත් ලබා ගන්න පුළුවන් කමක් නැහැ.

මෙවැනි තත්වයක් ඇති වුනේ, ඓතිහාසික මෙන්ම වෙනත් කරුණු ගණනාවක් නිසයි. එක කලෙකදී අපේ රටේ ජනතාව අතර ඔවුනට පමණක් ආවේනික එකමුතුකමක් තිබුණා. ඒ තත්වය වෙනස් වුනේ, ලොකු වතුවල වැවිලි කර්මාන්ත ඇතිවීමත් සමගයි. වැවිලි කර්මාන්ත ආරම්භ වීමෙන් පරණ ක්‍රමය වෙනස් වෙලා ආර්ථික වශයෙන් වෙනම කොටස් දෙකක් ඇති වුනා—වැවිලිකරු සමාජය සහ ගොවි සමාජය. වැවිලිකරු පොහොසත් සමාජයේ කොටස් කරුවෙක් වූ අතර ගොවි ජනතාව ගැන උනන්දුවක් නොදැක්වූ හෙයින් ඔවුන් අන්ත දුගී බවට පත් වුනා. මෙහෙම කල් ගත වෙන කොට, ඉඩම් කෑඩී කෑඩී ගිහිල්ල, විශේෂයෙන් උඩරට පෙදෙසේ ගොවීන්ගේ ඉඩම් ඔවුනට අහිමි වෙලා ඔවුන් ඉතාමත් අවාසනාවන්ත තත්වයකට පත් වුනා. ඉඩම් නැතිකම විසඳා ගන්නට, නිදහස ලැබුණායින් පසුව ගත් පියවර සමාජය කෙරෙහි ඇති කළේ සීමාසහිත බලපෑමක්. මේ රටේ ඕනෑතරම් ඉඩම් තියෙනවා; ඒවායේ වැඩ කරන්න ජනතාව ඉන්නවා. මේ සම්පත් දෙක එකට එක්කරල ඒ මාර්ග දෙකෙන්ම ලබා ගන්නට පුළුවන් වැඩිම පල ප්‍රයෝජන ලබා ගැනීම අරමුණු කළ යුතුයි. වෙනත් වචනවලින් කියනවා නම් රජයේ අදහස විය යුත්තේ හැකි තරම් පුද්ගලයින් සංඛ්‍යාවක් ලාබ ලබා ගන්නට පුළුවන් වෙන විදියට කෘෂිකර්මයෙහි යෙදවීමයි. මෙය පළමුවැනි අවස්ථාවයි.

මේ කරුණු අනුව බලන කොට මෑතදී ඇතිවුණු නීතිරීති වලින් ඉඩම් ප්‍රතිසංස්කරණය ඉතා වැදගත්. ගැමි ජනතාව බොහෝ දෙනා

අතර සමාන විදියකට ඉඩ කඩම් බෙදී නැති නිසා ඒ ප්‍රශ්නය හරියාකාරව විසඳන්න පුළුවන් මාර්ගයක් තමයි, ඉඩම් ප්‍රතිසංස්කරණය. මේ රටේ වගා කළ බිම් ප්‍රමාණයෙන් හතරෙන් එක කොටසකට ආසන්න ප්‍රමාණයක් අයිතිව තිබුනේ 5000 ක් විතර පුද්ගලයන්ටයි. ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ මේ තනි අයිතිය නැති කර දමනවා. ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ අක්කර පන් ලක්ෂයක් විතර රජයට පැවරෙනවා. මේ ඉඩම් පාලනය කරන්නෙ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන්.

අතීතයේදී ගොවි ජනපද ව්‍යාපාරවලදී සිදු වුනේ තමන්ට නුපුරුදු පෙදෙසක ඉඩම්වලට ජනතාව රැගෙන යාමයි. ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් සිදු වන්නෙ තම තමන්ගෙ ගේ දොරට කිට්ටු, තමන්ට හුරුපුරුදු පළාතක ඉඩම් ජනතාවට බෙදා දීමයි.

ගොවිකටයුතු සඳහා මේ ඉඩම් ලබා දෙන්නේ කොහොමද? මෙය කරන්න පුළුවන් පහසු ක්‍රම තුන හතරක් තියෙනවා. පවුලේ ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා මේ ඉඩම් දෙන්න පුළුවන්; නැති නම් සමුපකාර මගින් සේවාවන් පවත්වාගෙන යන්නට පුද්ගලික අයට හෝ එහෙමත් නැත්නම් සමූහ ගොවිපලක් හෝ රජයේ ගොවිපලක් පවත්වාගෙන යන්නට මේ ඉඩම් දෙන්නට පුළුවනි. රජයට පැවරී ඇති ඉඩම් බෙදා දීම පිළිබඳ විස්තර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම මගින් දැන් සලකා බලාගෙන යනවා.

ඉඩම්වල ජනාවාස ඇති කිරීමේ නොයෙක් ක්‍රම ගැන සලකා බැලීමේදී ඇතැම්විට තරමක වැරදි අවබෝධයක් ගැබ්ව තිබී, අතීත අත් දැකීම් ගැන තදින්ම විශ්වාසය තියන්නේ නැතිව විවෘතව සිතා බැලීම වැදගත්. පෞද්ගලික පවුල් ගොවිපලවල් වලට අමතරව සමුපකාර සහ සමූහ ගොවිපලවල් පිහිටුවා ඒවා හොඳින් ක්‍රියාත්මක වේදැයි පරීක්ෂා කරගෙන යනවා.

ජනාවාස සැලසුම්, ඉඩම් භාවිතය සහ සංවර්ධන අංශය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වැදගත් අංශයක්. ඉඩම් කොමිෂන් සභාවේ ඉඩම්වල ජනයා පදිංචි කරවීම සහ එම ඉඩම් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ සියලුම ප්‍රශ්න ගැන කටයුතු කිරීම මේ අංශයට බාර වෙලා තියෙනවා. එක් එක් ඉඩම් සඳහා අදහස් කර ඇති ජනාවාස යෝජනා ක්‍රම අනුව, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරවලද අදහස් විමසා ඉඩම්වලට පදිංචිකරුවන් තෝරා ගැනීමත් මේ අංශයට අයිති කටයුත්තක්. ඉන් පසුව, ඉඩම් සංවර්ධනය කිරීමට සැලසුමක් පිළියෙල කරල, පදිංචිකරුවන් සමග සාකච්ඡා කරල එය ක්‍රියාත්මක කරනවා. මේ වනතෙක් ලොකු වතු 11 ක සමුපකාර ජනාවාස සංවිධානය කරල ක්‍රියාත්මක කරගෙන යන අතර තවත් වතු 14 ක් සඳහා ජනාවාස සැලසුම් වැඩ සටහන් පිළියෙල කර තියෙනවා. ආදර්ශ ගම්මාන වශයෙන් සමුපකාර ජනාවාස ක්‍රම 30 ක් පිළියෙල කිරීමට අදහස් කරනවා.

කොහොම උනත් සමහර මඩ ඉඩම්, වගා නොකළ ඉඩම් සහ පතන ඉඩම් වහාම බෙදා දිය යුතු යයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මේ අතරතුර තීරණය කළා. එහෙම කළේ දැන් වේගයෙන් කරගෙන යන ආහාර නිෂ්පාදන ව්‍යාපාරය තවත් වේගවත් කරන්නයි. ඉඩම් මැනල, බෙදා දිය යුතු අය තෝරා ගත්තු ඉක්මණින් ඉඩම් බෙදල දෙන්න කටයුතු කරනවා.

සමුපකාර ගොවිපල ක්‍රමය පිළිබඳව මේ සඟරාවේ වෙනත් කලාපයකින් සාකච්ඡා කිරීමට පුළුවන්.

ගොවිතැනින් ලැබෙන ආදායම වැඩි කර ගන්නට ගොවීන්ට උදව් වන්නෙ නැත්නම් ඉඩම්වල අයිතිය මාරු කිරීමෙන් පමණක්ම, ගොවිජන සේවා අංශයෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. කෙසේ වෙතත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවන් මගින් ඔබට සපයන දැනුම හා නිෂ්පාදනය පිළිබඳ කරුණු ප්‍රයෝජනයට ගැනීමට ඔබ සැලකිල්ලක් දක්වන්නේද? ගොවි කාරක සභා සහ සමුපකාර ආදියට සහභාගී වී ඒවා සාර්ථක කර ගැනීමට ඔබ හොඳින් ආධාර කරන්නේද? ගොවි කටයුතු වලදී ඔබ මුහුණ දෙන අමාරුකම් හා ගැටළු පිළිබඳව අවංකව කථා කිරීමට ඔබ සැලකිල්ලක් දක්වන්නේද? ආදී වශයෙන් අන්තිමේදී ගොවි කටයුත්තක සාර්ථක බව රඳා පවත්නේ ගොවියෙක් වශයෙන් ඔබ අතේමයි. මේ ප්‍රශ්න ගැන කථා කිරීමට සුළු වශයෙන්වත් මෙ සඟරාව ඔබට අවස්ථාවක් සලසා දෙනවා ඇති.

මෙතෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් කර ඇති වැඩ පිළිබඳ විස්තර සහිත ලිපියක් "ගොවි ජනතාව" සඟරාවේ ඊළඟ කලාපයේ පළ වනවා ඇති.